# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: (94)-011-2484500, (94)-011-2484600, (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PFD/RED/REG/02/CC/2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.05. 26

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ගිණුම්**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය අනුව, ඔබ විසින් විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු බව සඳහන් වේ. 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10 ඡේදයේ සඳහන් පරිදි ඔබ ආයතනය සහ ඔබ යටතේ පවතින සියළුම ආයතන 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සමඟ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව ද, උක්ත චක්‍රලේඛ විධිවිධාන පරිදි රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2021.11.26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 අනුව 2022.02.28 දින වනවිට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇතැයි අදහස් කරමි.

02. ඉහත 01 ඡේදයේ සඳහන් පරිදි ඔබ ආයතනය විසින් විගණකාධිපතිවරයා වෙත අදාළ වාර්තා ඉදිරිපත් කර තිබුණ ද, දැනට රට තුළ පවතින වාතාවරණය අනුව, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 12 ඡේදයේ විධිවිධාන අනුව, භාෂාත්‍රයෙන් සකස් කරන ලද 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව, මුදල් වර්ෂය අවසන් වී දින 150 කට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපහසුතාවයක් ඇති වුවහොත්, එකී රාජ්‍ය ආයතන වෙනුවෙන් 2021 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ දිනය 2022.06.30 දින දක්වා දීර්ඝ කරන බව කාරුණිකව දන්වමි.

කේ.එම්.එම්. සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: (1) ජනාධිපති ලේකම්
(2) අග්‍රාමාත්‍ය ලේකම්
(3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(4) ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(5) විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
(6) සභාපති, මුදල් කොමිෂන් සභාව